


(C) Sumitha Publishers

**ගල් ගෙට යන පාර**

මේ ගල් ගේ පිහිටියේ පදේගම්පොළ කඳු වැටිය පාමුල ය. ඒ කන්ද මුදුනෙහි පිහිටි ගල් ලෙන්වල බ්‍රාහ්මී අක්ෂරවලින් ලියූ ලෙන් ලිපි ඇත. දැළිවල කොටවෙහෙරේ කළ කැනීම්වල දී අනුරාධපුර යුගයට අයත් කරඬු හමු විණ.

මේ 'ගල් ගේ' දෙවියන් විසින් මවන ලද්දකැයි බෞද්ධයන් සිතුවත් එය ඉදි කරන්නට ඇත්තේ ඈත අතීතයෙහි පාෂාණ යුගයට අයත් වූ ආදිවාසීන් විසිනැයි ඉතිහාසඥයෝ කියති. ඒ අනුව මෙය මෙරට පිහිටි පැරණිතම ප්‍රාග්ඓතිහාසික ස්මාරකය වෙයි. මිනිසුන් විසින් ඉදි කරන ලද මෙවැනි ගල් ගෙවල් පුරාවිද්‍යාඥයන් හඳුන්වන්නේ 'dolmen' (ඩොල්මෙන්) යන නමිනි.

(C) Sumitha Publishers

මෙය ලංකාවෙහි ඇති එක ම ගල් ගෙය යි.

පදේගම්පොළ පිහිටා ඇත්තේ රඹුක්කනට සැතපුම් දෙකක් පමණ දුරිනි. පින්නවල අලි අනාථාගාරය බලා ආපසු එන්නට කලින් රඹුක්කනට ගොස් වල්ගම් පාරේ හැතැප්මක් පමණ ගිය තැන කොරහැත්ත හන්දිය හමු වෙයි. එතැනින් දකුණට හැරී හැතැප්ම භාගයක් පමණ ගිය විට මේ ගල් ගේ හමු වෙයි.

මිහිඳු මහ රහතන් වහන්සේට
දෙවන පෑතිස් රජතුමා හමු වුණෝ
මිහින්තලා කඳු මුදුනෙ දීය.
උන් වහන්සේගෙන් බණ ඇසූ රජතුමා
බෞද්ධයෙකු බවට පත් විය.
දහස් ගණන් ගැහැනු පිරිමි ද
බුදු දහම වැළඳ ගත්හ.
ඒ ක්‍රිස්තු වර්ෂයෙහි උදාවට
ශත වර්ෂ තුනකට පමණ උඩ දී ය.
සමහරු පැවිදි බිමට ඇතුළු වී
මහණ දම් පුරමින් ගල් ලෙන්වල විසූහ.

(C) Sumitha Publishers




(C) Sumitha Publishers

ගල් ලෙන්වල
බණ භාවනා කරමින්
සිත නිවා ගත්
සමහර භික්ෂූන් වහන්සේලා
රහත් බවට පත් වූහ.
මේ රහතන් වහන්සේලා
ලක්දිව පුරා ගමින් ගමට යමින්
වැඩි දෙනාගේ හිත සුව පිණිස
බුදු බණ කියා දුන්හ.

(C) Sumitha Publishers

